*සැ. යු.* - 2011.08.19 දින පළ වූ අංක 1720 දරන *ගැසට් පත්‍රයේ* I-II (අ) කොටස පළ නොවීය.
මෙම *ගැසට් පත්‍රයේ* දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,721 - 2011 අගෝස්තු මස 26 වැනි සිකුරාදා - 2011.08.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1086 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1091 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1094 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි **ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 සැප්තැම්බර් මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 අගෝස්තු මස 19 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අම්බලන්ගොඩ නගර සභාව

### දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | 11,730-10x120-10x130 -10x145-12x160-17,600 PL 1-2000A (12 පියවර) | යටත් පිරිසෙයින් 08 වැනි ශ්‍රේණිය හෝ ඒ හා සමාන වෙනත් විභාග යකින් සමත් වී සිටීම. |

*බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :*

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය;
(2) යහපත් ශරීරයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය;
(3) ඉල්ලුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-45ත් අතර විය යුතු ය;
(එහෙත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ස්ථිර සේවකයන් සම්බන්ධයෙන් මෙම උපරිම වයස් සීමාව බල නොපානු ඇත.);
(4) ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට පූර්වාසන්නයෙන් වූ වසර 03ක කාලයක් තුළ දකුණු පළාතේ ස්ථිර පදිංචිකරුවන් විය යුතු ය. (අම්බලන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.);
(5) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී හෝ රජයේ හෝ රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූ අයෙකු නොවිය යුතු ය;
(6) සභා සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට ප්‍රමුඛත්වය දෙනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(1) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරා ගනු ලැබේ ;
(2) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය ;
(3) වැන්දඹු පුරුෂ හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකත්වය සඳහා මුදල් අය කෙරේ ;
(4) පත්වීම් ලැබූ දින සිට අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ ;
(5) මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවලටද වරින් වර දකුණු පළාත් සභාව හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරන නීති හා නියෝගවලට යටත් විය යුතුය;
(6) මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

01. මෙම නිවේදනයේ ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් ඉදිරිපත් කල යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ අදාළ තනතුර සඳහන් කල යුතු ය.

02. සම්පූර්ණ කරන ලද අයදුම්පතේ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද සමග 2011 අගෝස්තු 30 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් "ලේකම්, නගර සභාව, අම්බලන්ගො" ඩ යන ලිපිනයට එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සහතික,
(ඇ) පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සහතික කළ ග්‍රාම නිලධාරී සහතිකය
(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්,
(ඉ) වෘත්තීය හෝ පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කෙරෙන සහතික.

*සැලකිය යුතුයි -*

1. දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශය මත එවිය යුතු ය.
2. අයදුම්පත් සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඩී. වී. සුනිල්,
ලේකම් (වැඩ බලන),
නගර සභාව,
අම්බලන්ගොඩ.

අම්ලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යොමු අංකය :————————
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම් පත්‍රය**

***අම්බලන්ගොඩ නගර සභාව***

*-------------------------තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————,
02. මුලකුරු සමග නම :————————,
03. ස්ථිර ලිපිනය :————————,
04. උපන් දිනය: වර්ෂය:————————, මාසය:————————, දිනය: ————————,
05. අයදුම්පත් භාරගන්නා දිනට වයස :————————,
06. ජාතිය:————————,
07. ආගම:————————,
08. විවාහක/අවිවාහක බව:————————,
09. ස්ත්‍රී/පුරුෂ භාවය:————————,
10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් ඒ පරම්පරාවෙන් ද/ලියාපදිංචිවීමෙන් ද යන වග:————————,
11. නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය:————————,
12. අධ්‍යාපන සුදුසුකම් :————————,
(1) අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| *විෂයයන්* | *සාමාර්ථ* | *විෂයයන්* | *සාමාර්ථ* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

13. ඔබ ලබා ඇති ඉහලම අධ්‍යාපන සුදුසුකම් :————————,
14. වෙනත් සුදුසුකම් :————————,
15. සේවා පළපුරුද්ද :————————,
16. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවෙකු වී තිබේ ද ? :————————,

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සපයා තිබුනහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව මාගේ අපේක්ෂකත්වය අවලංගු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් දන්වමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————

**රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා**

ඉහත නම සඳහන් .......................................... මයා දැනට මෙම ආයතනයේ ................................................ වශයෙන් සේවය කරයි.

ඔහු/ඇය මෙම තනතුරට තෝරා ගතහොත් සේවයෙන් නිදහස් කළ හැකිය/නොහැකිය. ඔහු/ඇය විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත් නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————————,
පදවි නාමය :————————,
දෙපාර්තමේන්තුව/ආයතනය :————————,
(නිල මුද්‍රාව තබන්න)

දිනය:————————,

08-690

## නිවැරදි කිරීමයි

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

2011.07.01 වැනි දින අංක 1713 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) වැනි කොටසේ තනතුරු ඇබෑර්තු යටතේ අංක 07-131 දරන නිවේදනයේ, අනු අංකය (11) යටතේ රියදුරු පුරප්පාඩු සංඛ්‍යාව 03 ලෙස මුද්‍රණය වී ඇති අතර, එය 02 ලෙස නිවැරදි විය යුතු ය.

කේ. එච්. එස්. අබේසුන්දර,
නාගරික ලේකම් (වැඩබලන),
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2011 අගෝස්තු මස 11 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව,
රාජගිරිය.

08-666

---

### ආණමඩුව ප්‍රාදේශීය සභාවේ තනතුරු පුරප්පාඩු පිරවීම

ආණමඩුව ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරුවලට සුදුස්සන් තෝරා පත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය හා ශ්‍රේණිය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් බණ්ඩය* | *වැටුප් ක්‍රමය (මාසික)* | *සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III | 02 | PL3-2006A | රු. 12,470-10x130-10x145 -10x160-12x170-18,860.00 | *අධ්‍යාපන සුදුසුකම්*<br>*බාහිර අයදුම්කරුවන් සඳහා*<br>(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොඅඩු වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයයන් 02කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවකදී විෂයයන් 05ක් සමත්විය යුතු ය.<br>*අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා*<br>(ආ) දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසැලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුයි.<br>2. අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් හා සේවා ගිවිසුම් මත බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවැති බඳවා ගැනීම් පටිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.<br>3. ශිල්පීය නිපුනතා/ප්‍රවීනතා හා පළපුරුද්ද<br>තාරබර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ටේලර් සහ මගීන් 32කට වඩා රැගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් සකස් කරන ලද නිපුනත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (A පන්තියේ රියදුරු බලපත්‍රයක්)<br>4. රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුයි). තනතුරට අදාළ වන පරිදි වෘත්තීය සම්මුඛ පරීක්ෂණයක් මගින් හා වෘත්තීය ප්‍රවීනතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක් මගින් සුදුස්සන් බඳවා ගැනේ. |

| අනු අංකය | තනතුරු නාමය හා ශ්‍රේණිය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ඛණ්ඩය | වැටුප් ක්‍රමය (මාසික) | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 02 | වැඩ පරිපාලක<br>නළ ළිං ක්‍රියාකරු | 02<br>01 | PL-2-2006A | රු. 12,210-10x130-10x145 -10x160-12x170-18,600.00 | *අධ්‍යාපන සුදුසුකම් :-* |

බාහිර අයදුම්කරුවන් සඳහා

(අ) අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී යටත් පිරිසෙයින් විෂයන් 2ක් වත් සමත් වී තිබිය යුතු ය. (වෛකල්පිත විෂයන් හැර)

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා

(ආ) පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා රජය විසින් අනුමත කරන ලද පාසැලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වීම.

2. මෙම පරිපාටිය ක්‍රියාත්මක දින වන විට ප්‍රාථමික අර්ධ ශිල්පීය තනතුරු සඳහා අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට පමණක් පෞද්ගලික වන සේ එවකට පැවති බඳවා ගැනීමේ පරිපාටියේ අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ.

3. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා
අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන N.V.Q. 2 හෝ 3 මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

4. පළපුරුද්ද
එක් එක් විෂයට අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක රාජ්‍ය සංස්ථා/මණ්ඩල ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජයේ පිළිගත් ආයතනයක් යටතේ යටත් පිරිසෙයින් වසර 02කට වැඩි කාලයක් සේවය කර තිබීම. (සහතික මගින් සනාථ කළ යුතුය.)

පොදු කොන්දේසි :-

01. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :-*

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
ii. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
iii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ. මෙම බඳවා ගැනීම් ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලටද මුදල් රෙගුලාසි වලට දෙපාර්තමේන්තු රෙගුලාසි වලටද, රජයේ හෝ පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරන වෙනත් රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව ක්‍රියා කිරීමට බැඳී සිටිය යුතු ය.

02. *වයස :-*

i. 2011.09.14 වැනි දිනට වයස අවු. 18කට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය.
ii. දැනටමත් අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන ඇති සේවකයින්ට ඔවුන්ට පමණක් පෞද්ගලික වන සේ උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.

03. *වෙනත් සුදුසුකම් :-*

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වසර 03ක් ආණමඩුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු වීම (පදිංචිය ග්‍රාම නිළධාරී විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මගින් අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සහතික කර තිබිය යුතු ය).
iii. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් විය යුතු යි.
iv. දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙකු නම් ඔහුට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු ය.
v. යම්කිසි උසාවියකින් වරදකරු වී දඬුවම් ලබා නොතිබිය යුතු ය.

04. *ස්ථිර කිරීම* :-

i. සේවයේ/තනතුරේ III වැනි ශ්‍රේණියට පත්කරනු ලබන සේවකයෙකු තුන් වසර (03) ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබීමෙන් පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් වීමෙන් අනතුරුව සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* : -

i. සම්මුඛ පරීක්ෂණයක් මගින් අදාළ සුදුසුකම් පරීක්ෂා කර සුදුස්සන් තෝරාගනු ලබන අතර, රියදුරු තනතුර සඳහා පමණක් ලිඛිත ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

ii. මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2011.09.14 වැනි දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, ආණමඩුව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කල යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුරේ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ හෝ වෙනස් කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සම්පූර්ණ බලතල ආණමඩුව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුවේ.

ආර්. එම්. ටී. කේ. රත්නායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව,
ආණමඩුව.

2011ක්වූ අගෝස්තු මස 09 වැනි දින,
ආණමඩුව,
ආණමඩුව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

ආණමඩුව ප්‍රාදේශීය සභාව

....................................... තනතුර සඳහා අයදුම් පත්‍රය

01. i. අයදුම්කරුගේ නම මුලකුරු සමඟ :————.
ii.මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. තැපැල් ලිපිනය :————.
03. උපන් දිනය වර්ෂය :————, මාසය :————, දිනය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.
05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු. :————, මාස :————, දින :————.
06. ස්ත්‍රී, පුරුෂ භාවය :————.
07. විවාහක/අවිවාහක බව :————.
08. ජාතිය :————.
09. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද යන වග :————.
10. අධ්‍යාපන සුදුසුකම් අ. පො. ස. (සා. පෙළ) :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම කාලය සහ විස්තරය, එම පත්වීමේ ස්වභාවය : ස්ථිර/අනියම්/ආදේශක/ගිවිසුම්/තාවකාලික ද යන වග :————.
12. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම් :————.

13. මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත්, ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුර තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

08-635

# පළාත් පාලන නිවේදන

## වවුනියා නගර සභාව

(255 වැනි අධිකාරය) නගර සභා ආඥාපනතේ 44 (1) හා (2) වැනි වගන්ති යටතේ කරනු ලබන දැන්වීම

(255 වැනි අධිකාරය) නගර සභා ආඥාපනතේ 44(1) හා (2) වැනි වගන්ති ප්‍රකාර උතුරු පළාතේ පළාත් සභාවේ වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියාව නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් වවුනියාව නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළව ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා (255 වැනි අධිකාරය) නගර සභා ආඥාපනතේ 44 (1 හා 2) වැනි වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ග වවුනියාව නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

අයි. කනගයියා,
සභාපති,
නගර සභාව,
වවුනියාව.

*උපලේඛනය*

| *මාර්ගයේ නම* | *මාර්ගයේ ආරම්භය* | *මාර්ගයේ අවසානය* | *ග්‍රාම නිලධාරි වසම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* |
|---|---|---|---|---|---|
| ආරුමුග නාවලර් පාර | පූන්තෝට්ටම් පෙරියකුලම් පාර | සාන්ත සෝලෙයි පාර | 214/සී වවුනියා උතුර | 183එම් | 10එම් |

08-594

---

## වරකාපොල ප්‍රාදේශීය සභාව

*වරිපනම් බල ප්‍රදේශය පුළුල් කිරීම*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වැනි වගන්තිය යටතේ වරකාපොල ප්‍රදේශය තුළ පිහිටි දැනට දියුණු ගම් වශයෙන් ප්‍රකාශයට පත් කර වරිපනම් බදු අයකරන ප්‍රදේශවලට අමතරව බල ප්‍රදේශයේ තවත් ප්‍රදේශ කිහිපයක වරිපනම් බදු අයකිරීමට සුදුසු බවට 2010.04.07 දිනැති මහා සභා රැස්වීමේ තීරණ අංක 08-02-06 මගින් සභා සම්මත කරන ලද යෝජනාව අනුව පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් අනුමත කර ඇති පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශ ද දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කර වරිපනම් බදු අය කිරීමට කටයුතු කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කීර්තිසිරි විජේතුංග,
සභාපති,
වරකාපොල ප්‍රාදේශීය සභාව.

**යෝජිත මාර්ගය :**

1. (කොළඹ නුවර පාරේ තෝලංගමුව පනාන හංදියේ සිට ඔත්නාපිටිය පාර උඩුකුඹුර ඇතුළත්ව කනදෙනිය දක්වා පාර)

*වම් කොටස* - පනාන හන්දියේ ඩී, පී. රණසිංහ මහතාට අයත් තහඩු සෙවිලි තේ කඩයේ සිට කණදෙනිය ප්‍රදේශයේ සමරසේකර මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද

*දකුණු කොටස* - පනාන හන්දියේ සිට ඒ. ඩබ්. එස්. සිල්වාට අයත් කොන්ක්‍රීට් වහලය සහිත නිවසේ සිට කනදෙනිය ප්‍රදේශයේ පාලිත මහතාට අයත් ඉඩම් කොටස දක්වා වූ සීමාව ද ඊට අමතරව උඩුකුඹුර හන්දියේ සිට ඔත්නාපිටිය දක්වා දිවෙන පාරේ වම් පසට ඩබ්. ඒ. ගුණතිලක මහතාට අයත් ගොඩනැගිල්ලේ සිට ඔත්නාපිටිය ප්‍රාදේශයේ ශාන්ත මහතාට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද දකුණු පසට උඩුකුඹුර හන්දියේ පල්ලිය සිට ඔත්නාපිටිය ප්‍රදේශයේ ප්‍රියන්ත පුෂ්පකුමාර මහතාට අයත් තහඩු සෙවිලි කඩය දක්වා වූ සීමාව ද

2. (කොළඹ-කුරුණෑගල මාර්ගයේ වාරියගොඩ නගරයේ සිට ඕපාත ප්‍රදේශයට වූ වරිපනම් සීමාව)

වම් පසට - වෛද්‍ය අසේල මහතාට අයත් තනාගෙන යන නිවසේ සිට ඕපාත ප්‍රදේශයට අයිතිකරු 15/6D උළු සෙවිලි නිවෙස දක්වා වූ සීමාව ද,
දකුණු පසට - මාපා ගුණරත්න මහතාට අයත් පොල් ඉඩමේ සිට ඕපාත ප්‍රදේශයට පී. එච්. වික්‍රමසිංහ මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද,
ඊට අමතරව වාරියගොඩ සිට ඕපාත ප්‍රදේශයට දිවෙන මාර්ගයේ සමෘද්ධි පොළ අසලින් වද්දෙණිය ප්‍රදේශයට,
වම් පසට - මනෝරි හෝටලය උළු සෙවිලි කල ගොඩනැගිලි සීමාව,
දකුණු පසට - සමෘද්ධි පොළ අසලින් වද්දෙනිය ප්‍රදේශයට එස් කරුණාතිලක මහතාට අයත් ඇස්බැස්ටස් සෙවිලි ගොඩනැගිලි සීමාවෙන් පටන් ගෙන වද්දෙනිය ප්‍රදේශයේ සණස වත්ත නම් වූ ඉඩම් කොටසේ සීමාව දක්වා ද.

3. (අල්ගම නගරයේ වරිපනම් සීමාව
අල්ගම නගරයේ වරකාපොල නිට්ටඹුව ප්‍රධාන මාර්ගයේ)

වම් පසට - කේ. සුනේත්‍රා වීරක්කොඩි මහත්මියට අයත් උළු සෙවිලි කළ නිවසින් පටන්ගෙන නිට්ටඹුව ප්‍රදේශයට අල්ගම මධ්‍ය මහා විද්‍යාලය දක්වා වූ සීමාව ද
දකුණු පසට - වරකාපොල නිට්ටඹුව මාර්ගයේ එස්. එන්. පියසේන මහතාට අයත් ඉඩම් කොටසින් පටන් ගෙන නිට්ටඹුව මාර්ගයේ කවිරාජ් සිරිසේන ධර්ම ශ්‍රී මහතාට අයත් බෙහෙත් ශාලාව දක්වා වූ සීමාව ද,
ඊට අමතරව අල්ගම සිට උඩුවකට දිවෙන මාර්ගයේ,
දකුණු පසට - අල්ගම විහාරස්ථානයෙන් පටන්ගත් සීමාවේ සිට ඒ. එම්. චන්ද්‍රසිරි මයාගේ උළු සෙවිලි ඇඹරුම් හල දක්වා වූ සීමාව ද
වම් පසට - අල්ගම සිට උඩුවක දක්වා දිවෙන මාර්ගයේ සමෘද්ධි පෙර පාසල සීමාවේ සිට සුනිල් සේනාරත්නට අයත් ඇස්බැස්ටස් සෙවිලි තේ කඩයද දක්වා වූ සීමාව ද.

4. (කොළඹ නුවර පාරේ මාහේන ඉඹුලෝවිට මාර්ගයේ යෝජිත වරිපනම් සීමාව)

වම් පසට - කොළඹ නුවර ප්‍රධාන මාර්ගයේ මාහේන සිට ඉඹුලෝවිට මාර්ගය ප්‍රේමදාස මහතාට අයත් උළු සෙවිලි නිවසින් පටන්ගෙන හේමතිලක මහතාට අයත් කොන්ක්‍රීට් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද,
දකුණු පසට - චන්ද්‍රසේන මහතාට අයත් උළු සෙවිලි නිවස සහ බේකරිය පටන්ගෙන මාර්ගයේ කොළඹ පාරට,
වම් පසට - කුඹුරු පසුකරමින් ජල ටැංකිය අසලින් සමන් මහතාට අයත් උළු සෙවිලි නිවස සිට සුමනදාස මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ කොටස ද,
දකුණු පසට - බන්ඩාර මහතාට අයත් උළු සෙවිලි නිවසින් පටන්ගෙන රවි මහතාට අයත් සාදාගෙන යන නිවස දක්වා සීමාව ද.

5. (මීරිගම පාර යෝජිත වරිපනම් සීමාව)
වම් පසට - කොළඹ නුවර පාරේ මීරිගම පාර දැනට වරිපනම් බදු අයකරන සීමාවෙන් ඔබ්බට ගලේ පන්සල පසුකරමින් ඩී. එස්. සුනිල් මහතාගේ උළු සෙවිලි නිවසින් පටන්ගෙන ධර්මවර්ධන මහතාට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
දකුණු පසට - කොළඹ නුවර පාරේ මීරිගම පාර දැනට වරිපනම් අයකරන සීමාවේ කේ. ඒ. ටී. රත්නසීලිට අයත් උළු සෙවිලි නිවසේ සිට ඉදිරියට ඉන්දිරා තිලකරත්න මහත්මියට අයත් කොන්ක්‍රීට් සෙවිලි නිවස දක්වා වූ කොටස.

6. (කොළඹ පාරේ නව රෝහල පාර යෝජිත වරිපනම් සීමාව)
වම් පසට - නව රෝහල පාරේ දැනට වරිපනම් බදු අයකරන සීමාවෙන් ඔබ්බට රංගන ගුරුගේ මහතාට අයත් ඇස්බැස්ටස් සෙවිලි ලැගුම්හල සිට බාලසූරිය මහතාගේ ඇස්බැස්ටස් සෙවිලි දෙමහල් නිවස දක්වාවූ සීමාව ද
දකුණු පසට - නව රෝහල පාරේ දැනට වරිපනම් අයකරන සීමාවෙන් ඔබ්බට එස්. පී. දයාරත්න මහතාට අයත් තහඩු සෙවිලි කුඩා නිවසේ සිට විජේරත්න මහතාගේ ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා සීමාව ද,
ඊට අමතරව නව රෝහල පාරේ ඇස්බැස්ටස් සෙවිලි ටෙලිකොම් ආයතනය ඉදිරිපිට ඇති මාර්ගයේ
වම් පසට - කරුණාරත්න මහතාට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවසේ සිට උපුල් මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
දකුණු පසට - අයිතිකරු ඇස්බැස්ටස් සෙවිලි නිවස සිට රංජිත් මහතාගේ ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද

7. පිලාඩුව පන්සල පාර යෝජිත වරිපනම් සීමාව

වම් පසට - අඟුරුවැල්ල පාරට මුහුණලා පිළාඩුව බෞද්ධ විද්‍යාලයේ ආරියසේන ප්‍රකාශන ආයතනයේ සිට අධිකාරි මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද නැවත වම් පසට හැරී බටන්ගල මහතාට අයත් උළු සෙවිලි නිවස. ආර්. එම්. නීල් චන්දන කුමාර මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාවන්
දකුණු පසට - ආර්. රණවන මහතාට අයත් උළු සෙවිලි නිවස හා පෙර පාසලේ සිට එස්. ඒ. ශ්‍රියාණි මල්ලිකාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද

8. පිළාඩුව පන්සල පාර යෝජිත වරිපනම් සීමාව

වම් පසට - රශිකා විලාසිනි රන්දුණු ගරා වැටුණු නිවසින් පටන්ගෙන ඩී. එම්. සුහසිංහ ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
දකුණට - එච්. කේ. සුනිල් ජයතුංග මහතාට අයත් ටකරන් සෙවිලි මිරිස් මෝලෙන් පටන් ගෙන ඩී. එම්. සුනිල් වික්‍රමසිංහ මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වාවූ සීමාව ද

9. දුම්මලදෙනිය මෙනෙරිපිටිය පාර යෝජිත වරිපනම් සීමාව

වම්පසට - ගාමිණී විද්‍යාලය අසලින් පටන්ගෙන මෙනෙරිපිටිය පාරේ ඇසිලින් ප්‍රේමාවතීගේ උළු සෙවිලි නිවස සිට ආර්. එම්. සුජිත් විමලරත්න මහතාගේ නිවස දක්වාවූ කොටස ද නැවත ඇල පසුකර ජේ. එම්. චාන්දනී ප්‍රියන්තිකා ජයලත් මහත්මියගේ ඇස්බැස්ටස් සෙවිලි නිවසින් පටන්ගෙන ආර්. එම්. සෝමපාල මහතාට අයත් උළු සෙවිලි නිවස හා කඩය හා ග්‍රාම නිලධාරි කාර්යාලය දක්වා වූ සීමාවද,
දකුණු පසට - ආර්. එම්. අමරාවතී මහත්මියට අයත් උළු සෙවිලි නිවසින් පටන්ගෙන මෙනෙරිපිටිය පන්සල දක්වා වූ සීමාව ද,

10. පැනිහෙල වසමට අයත් තිත්තවැල්මංකඩ යෝජික වරිපනම් සීමාව

වම් පසට - කොළඹ නුවර පාරේ තිත්තවැල්මංකඩ හන්දියේ සිට එම්. ඩබ්. ප්‍රේමසිරි මහතාට අයත් කොන්ක්‍රීට් සෙවිලි ගොඩනැගිල්ලෙන් පටන් ගෙන ඇග්නස් මහත්මියට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
දකුණු පසට - එල්. එම්. සිරිවර්ධන මහතාට අයත් කොන්ක්‍රීට් වහලය සහිත කඩයෙන් පටන් ගෙන ආර්. එම්. සමන්ත රාජපක්ෂ මහතාට අයත් තහඩු සෙවිලි යකඩ වැඩපල දක්වා වූ සීමාව ද

11. කඹුරාදෙනිය ප්‍රදේශයේ යෝජිත වරිපනම් සීමාව

වම් පසට - කොළඹ නුවර පාරේ කඹුරාදෙනිය ධර්මසේන හා බී එම්. ඩබ්. වික්‍රමනන්ද මහතාට අයත් පලතුරු කඩය හා නිවස සිට විජේනායක මහතාට අයත් තහඩු සෙවිලි ගරාජය දක්වා වූ සීමාව ද
දකුණු පසට - ආර්. ඩී. වික්ටර් කපුගෙදර මහතාට අයත් කුඹුර සිට රෙමානිස් අල්බට් එල්. ජයරත්න යන අයට අයත් පුරන් වූ කුඹුර දක්වා වූ සීමාව ද

12. මාහේනගම යෝජිත වරිපනම් සීමාව

වම් පසට - කොළඹ නුවර පාරේ මාහේන ප්‍රදේශය ලේකම් කාර්යාලයට වම් පසට කේ. ඒ. මංගල උළු සෙවිලි ගෙය හා කඩය සිට කාන්තිට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා වූ සීමාව ද දකුණු පසට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පටන්ගෙන රත්නසේන සුහසිංහ මහතාට අයත් උළු සෙවිලි ගෙය දක්වා වූ සීමාව ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වම් පසට අධ්‍යාපන කාර්යාලය දක්වා වූ කොටස ද
දකුණු පසට - අධ්‍යාපන කාර්යාලය ඉදිරිපස සුනිල් දයාරත්න මහතාට අයත් උළු සෙවිලි නිවස සිට පශු වෛද්‍ය කාර්යාලය අසලින් හැරී සිරිකාන්ති මැණිකේ මහත්මියට අයත් නිවස දක්වා වූ සීමාව ද,
වම් පසට - ප්‍රාදේශීය සභාවට අයත් දිවා සුරැකුම් මධ්‍යස්ථානය සිට ප්‍රේමාවතී මහත්මියට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වා සීමාව ද,

13. කුඩා ඔය අඹගල පාර - ටෙක්නිකල් පාර දක්වා කොටස

වම් පසට - ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් පිටුපස ඔය පසුකර වම් පසට ධර්මසේකර නමැති අයගේ නිවසින් පටන් ගෙන ආර්. ලීලාවතී මහත්මියගේ ටකරං සෙවිලි කුඩා නිවස දක්වා වූ සීමාව ද
දකුණු පසට - පාලමින් එහා කේ. ඒ. පොඩිමැණිකේ මහත්මියට අයත් කම්මල සිට දිලුම් විල්ලර ආරච්චිට අයත් ඇස්බැස්ටස් සෙවිලි නිවස දක්වාවූ සීමාව ද
වම් පසට - ආනන්ද සරත්කුමාර උළු සෙවිලි නිවස හා ගල් වැඩපල සිට කේ. වී. විජේසිංහ මහතාට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
දකුණු පසට - කේ. ඒ. ආනන්ද කුමාර මහතාට අයත් තහඩු සෙවිලි ගල්වැඩපල සිට මිල්ටන් සමරසිංහ උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද
වම් පසට - ටෙක්නිකල් ප්‍රදේශයට කේ. වී. සිරිවර්ධන මහතාගේ උළු සෙවිලි නිවස සිට යූ. පී. රමණී මහත්මියට අයත් උළු සෙවිලි නිවස දක්වා වූ සීමාව ද

සැ. යු. -

ඉහත සඳහන් මාර්ගවල මධ්‍ය රේඛාවේ සිට දෙපසට මීටර් 50ක් දුර ප්‍රමාණය ගණනය කිරීමේ දී යම් දේපලක කොටසක් පමණක් එම සීමාවට අයත්වන අවස්ථාවක දී මීටර් 50 සීමාව ඉක්මවා ඇති එම සම්පූර්ණ දේපලම තක්සේරු ඒකකයක් ලෙස සලකා අදාළ ගණනය කිරීම් කරනු ලැබේ.

08-688

# විවිධ දැන්වීම්

## දැරණියගල ප්‍රාදේශීය සභාව

දැරණියගල ප්‍රාදේශීය සභාව විසින් 1979.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි IV(ආ) කොටසේ අනුමත කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 27 හි පනවා ඇති ජල සම්පාදනය යටතේ 2011.06.28 දින අංක 08-04 දරන සභා සම්මුතිය පරිදි පහත සඳහන් ජල ගාස්තු 2011.09.01 වැනි දින සිට සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

2011.09.01 දින සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ජල ගාස්තු :

*සංශෝධනය විය යුතු ආකාරය*

*නිවස*

| | | *රු. ශත* |
|---|---|---|
| ස්ථාවර ගාස්තුව | - | 50 0 |
| මීටර් බද්ද | - | 20 0 |
| 0-10 | - | 2 0 |
| 11-20 | - | 5 0 |
| 21ට වැඩි | - | 10 0 |

*ව්‍යාපාරික*

| | | *රු. ශත* |
|---|---|---|
| ස්ථාවර ගාස්තුව | - | 50 0 |
| මීටර් බද්ද | - | 20 0 |
| 0-10 | - | 10 0 |
| 11-30 | - | 15 0 |
| 31ට වැඩි | - | 20 0 |

01. ජල ගාස්තු නොගෙවීම හෝ අතුරු ව්‍යවස්ථාව කඩ කිරීමක් මත විසන්ධි කරනු ලබන ජල සේවාවන් නැවත ලබාදීම සඳහා රු. 500 0 කි.

02. අනවසරයෙන් ජලය පරිහරණය කරනු ලබන බවට හෙළිවුවහොත් මාස 12ක් ඇතුළත මනු ගතව තිබූ උපරිම ඒකක ගණන මෙන් දස ගුණයක් වූ ඒකකයන් සඳහා වන ගාස්තු දඩ ගාස්තුවක් ලෙස ද ඊට අමතර රු. 2,500 ක අතිරේක ගාස්තුවක් ද අයකෙරේ.

03. පාරිභෝගිකයාගේ ඉල්ලීම මත විසන්ධි කරනු ලබන සේවාවන් නැවත ලබාදීම සඳහා රු. 250 ක් අයකෙරේ.

04. රජයේ පාසල් හා ආගමික ස්ථාන ජල ගාස්තුවලින් නිදහස් වේ.

ඩබ්. ඒ. අනුර විජේසූරිය,
සභාපති,
දැරණියගල ප්‍රාදේශීය සභාව.

2011 ජූලි මස 25 වැනි දින,
දැරණියගල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-658

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.